# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2227/2 - 2021 මැයි මස 10 වැනි සඳුදා - 2021.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 11 දරන මුදල් පනත

2006 අංක 11 දරන මුදල් පනතේ 8 වැනි වගන්තිය සමග කියවෙන එකී පනතේ 6(2) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින්, අංක 2044/21 දරන 2017 නොවැම්බර් මස 07 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 අංක 1 දරන මුදල් (ටෙලි නාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද) නියෝගවල උපලේඛනය I හි (ii) වන කොටස වෙනුවට මෙම *ගැසට් පත්‍රයේ* උපලේඛනය ආදේශ කිරීමෙන්, 2021 මැයි මස 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 මැයි මස 10 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය I

(ii) වන කොටස

| *වර්ගය* | *විකාශිත කාලය* | | *අනුප්‍රමාණය (රු.)* |
|---|---|---|---|
| ඕනෑම වාණිජ වැඩසටහනක් | යම් බලපත්‍රලාභී ආයතනයක් විසින් නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට යම් වාර ගණනක් විකාශය කිරීම සඳහා, | | |
| | (a) | නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට දින 30ක කාල පරිච්ඡේදයක් සඳහා | 100,000 |
| | (b) | නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට දින 183ක කාල පරිච්ඡේදයක් සඳහා | 500,000 |
| | (c) | නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට දින 365ක කාල පරිච්ඡේදයක් සඳහා | 1,000,000 |

05 - 423


1A - PG 5435 — 550 (2021/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*